විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විවැ/පා22/වි.වැ.ප්‍රතිශෝධන
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2019.12.10

**සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට විශ්‍රාම වැටුප් ගැලපීම</u>**

2019 අයවැය යෝජනා පරිදි විශ්‍රාම වැටුප් ගැලපීමේ යෙදී සිටින නිලධාරීන්ට ගෙවීමට නියමිත දිරි දීමනා සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මෙම වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. එබැවින් මේ වන විටත් විශ්‍රාම වැටුප් විෂමතා සකස් කර නොමැති විශ්‍රාම වැටුප් ලිපිගොනු පවතී නම්, එම විශ්‍රාම වැටුප් ගැලපීම් කටයුතු නොපමාව නිම කිරීමට අදාල විෂයභාර නිලධාරීන් දැනුවත් කර එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ඉහත පරිදි අවසන් කරනු ලබන විශ්‍රාමික ගොනු දත්ත පද්ධතියට දෙසැම්බර් මස 30 දිනට පෙර ඇතුලත් කළහොත් පමණක් දිරි දීමනා ගෙවීමට හැකිවන බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

03. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**මාළිගාවත්ත, කොළඹ 10.** மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk